# නිවේදනය

## කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය

**අංක 02/2022 හා 2022.08.31 දිනැති කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශ චක්‍රලේඛය යටතේ පූර්ණ විද්‍යුත් වාහන ආනයනය සඳහා බලපත්‍ර දරණ විදේශගත ශ්‍රමිකයින්ට එකී වාහන ආනයනයට පහසුකම් සැලසීම පිණිස වාහන ආනයනය කිරීමේ ආයතන ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පත් කැඳවීමයි**

1. එතෙර රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයින්ට පූර්ණ විද්‍යුත් වාහන ආනයනය කිරීම සඳහා බලපත්‍ර ලබාදීමේ යෝජනා ක්‍රමයෙහි බලපත්‍රලාභීන් වෙත වාහන ආනයනය කිරීම පහසුකම් සලසන ආයතන ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.
2. අයදුම්පත්‍රය අදාළ ආයතනයේ ව්‍යාපාරික ලිපි ශීර්ෂ භාවිතයෙන්, සපයා ඇති ආදර්ශ අයදුම්පත්‍රය (ඇමුණුම 1) ප්‍රකාරව ඉදිරිපත් කළ යුතුය.
3. අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමට පෙර ඇමුණුම 2 හි වූ කොන්දේසි කෙරෙහි නිසි අවධානය යොමු කළ යුතුය.
4. නිසි පරිදි පුරවන ලද අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් පමණක් යොමුකළ යුතුය.
5. ලියාපදිංචි තැපෑල සඳහා ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ " පූර්ණ විද්‍යුත් වාහන ආනයනය සඳහා බලපත්‍රලාභීන්ට පහසුකම් සැලසීමේ ආයතන ලියාපදිංචි කිරීම " ලෙස සඳහන් කර ලේකම්, කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය, 7 වන මහල, මෙහෙවර පියස, නාරාහේන්පිට, කොළඹ-05. යන ලිපිනයට 2023.05.04 දින ප.ව.2.00 ට හෝ ඊට පෙර එවිය යුතුය. ඉන් පසුව ලැබෙන අයදුම්පත් වෙතොත්, ඒවා සියල්ල ලියාපදිංචිය සඳහා 2023.05.20 දිනට සලකා බලනු ලැබේ.
6. මේ සම්බන්ධයෙන් අවශ්‍ය වැඩි විස්තර දුරකථන අංක 011-2368137 ඔස්සේ ලබාගත හැකිය.


ලේකම්,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය,

7 වන මහල, "මෙහෙවර පියස"

නාරාහේන්පිට,

කොළඹ 05.